සන්නස SANNASA

# පහන් වැටි

## යුද්දයක නටබුන්
බණ්ඩාර කුමාරනායක - වන්ට්ර්නා දකුන

නසා පරපණ ලබන තිළිණය උමතු සතුටක    පැටලිලා
වසා දෙනයන දකින සිහිනයෙ මරණ බය නැත    ගෑවිලා
වලා වක් වී බෙදන ජල බිඳ සදන ලොකය විඳ    වලා
ගලා එන මුදු සුලඟ සිප සිඹ ඉන්න බැරි තරමට    පෙලා

උපන්නට කුල බේද ජාතිය ආගමක් නැති ලෙස    ලොවේ
රකින්නේ තම අකුරු පෙල පත මානයේ මල්දම    නොවේ
නසන්නට තවෙකුගේ වරිගය රකින්නට හිස්    නම්බුවේ
අනින්නට අනිකගේ බොටුවට කිසිම විට පසුබට    නොවේ

අඬා වැලපී ගිහින් තවකෙකු සොයා පණනල    සිදින්නේ
කඩා වැටෙනා ඔහුගෙ සිරුරෙන් රැකුනු දරු වන්    අඬන්නේ
වඩා ගන්නට පියෙක් නැතිවට රජෙක් ජය කොඩි    වනන්නේ
විඩා වට සා පිපාසෙට ජල බිඳක් නැති උන්    තැවෙන්නේ

## ආචාර්‍ය ජයලත් මනෝරත්නයන්....,
ජයසේන කොඩිතුවක්කු

සිනහව  සතුට අරුතය මුසු කොට    යසට
නොමඳව ඉටුකළා මෙහෙවර    කලාවට
සැනසුව  සිත් සතන් ඔබ දස්කම්    වලට
නිසැකව හඬා වැළපෙයි ඔබ නැති    දුකට

තිරයේ  රිදී සහ ටෙලි    වේදිකාවේ
පිරුණේ කලා රස ඔබ රැඳි    වෙලාවේ
ලැබුණේ අත්වැළකි නව පරපුර    හමුවේ
එනිසයි පිදුනෙ දෙවියෙකු ලෙස    කලාවේ

මැව්වා  ශාන්ත ජෝශප් වීදියේ    කඩේ
හැදුවා  ගුරු තරුව එක් කොට ළමා    නඩේ
ගැයුවා රසට ගී පද නරි බෑණා    රගේ
මොනවා කරන්නද නෙත කඳුලැලි    හැමගේ

රඟන  ගයන විට පෙන් වූ සිනහ    රොද
පිරුණ මිනිස් යහ ගුණ පෙන්නුව    නොමඳ
ඇරුණ හදින් හැමට ම සෙනෙහස    බැන් ද
කළණ මිතුරු ඔබ මරු ළඟ    පැරදුනිද ?

## ජීවිතයට උදෑසනක්
තිලාෂා හසන්දී වන්නි ආරච්චි - 7 ශ්‍රේණිය

හිරු කුමරා  කන්ද  උඩින් එබී    බලනවා
කුකුල් හාමි නැගිට කුක්කු කූ    හඬදෙනවා
ලස්සන පොඩි පොකුරු පොකුරු මල්    හිනැහෙනවා
අපි සැම උදයෙම නැගිටල පාසැල්    යනවා

කීචි බීචි හඬ දසතින් අපට    ඇසෙනවා
කුරුලු රෑන් රෑන් අහසෙ පියා    සළනවා
රංචු සැදී  උන් වනයට ඉගිලී    යනවා
කෑම රැගෙන විත්  පොඩි පැටවුන්ට    කවනවා

පුංචි විලේ  රැලි අතරින් ඉහලට    එනවා
ලස්සන නෙළුමක් පිපිලා  සුවඳ    හමනවා
සමනලයට මී මැස්සට මේක    දැනෙනවා
තටු සලලා ඇවිදින් පැණි බීලා    යනවා

සීත සුළං රැල්ලක් ගත සිත ද    නිවනවා
වී  සමගම නටන ගොයම් නෙත්    පිනවනවා
වක්කඩ ළඟ තිත්ත පැටවු පීනා    යනවා
පිල් විදහාගත් මොණරුන්  නැටුම්    නටනවා

මේ සුන්දර උදෑසනේ අකුරට    යන්නේ
සිත සතුටින් ප්‍රබෝධයෙන් නොවැ අප    ඉන්නේ
අකුරට ගොස් හොඳ හොඳ දේවල්    උගනිමිනේ
මේ ලෙසටයි  ජීවිතයට සතුට    උපන්නේ



## වැඩමුරය අවසන්
බණ්ඩාර කුමාරනායක - වන්ට්ර්නා දකුන

ගොම් මන් කළුවර පය    පෑගෙනවා
තනියට අඹු දරුවන් සිහි    වෙනවා
දවසක මෙහෙවර අවසන්    කරවා
නැවුම් සතුටකින් පා සොල    වනවා

හිරි පොද වැස්සට පාලුව    ලියලා
අදුරු දෙවැට මග මූසල    ගලලා
ඇදුනු සිහින පොදි ටික ඔප    දමලා
ගතට වඩා සිත වේගෙන්    දුවලා

රැහි හඩන හඬ ඉස්මතු    කරලා
ඇල්ලෙ හැලෙන ජලකඳ හෝ    ගාලා
ඇගේ රුදාවට පිළියම    සොයලා
සීපද හඬ රැව් දෙයි සැම    වටලා

කනත්ත ලග සුදුකොඩි ලෙල    දෙනවා
මැරිච්ච සාපින් කොඩි දැක    නැතුවා
වැටෙන්න පෙර ලෙඩ ඇදට පව    ගෙවා
ලැබිච්ච දිවියේ හැඩ වැඩ    ඇතුවා



## විස්සයි විස්ස සුබ නව වසරක් වේවා!
ජයසේන කොඩිතුවක්කු

ගත  වුන අතීතයෙ දුක.දුළු පිස    දමමු
මත  වාදයන් පසෙකට ලා පෙරට    යමු
අත  හිත දෙමින් සාමයෙ ජය හඬ    නගමු
සිත යහ ගුණයෙ තෝතැන්නක් ලෙස    හදමු

නව  මාවතක රට ජාතිය බුදු    දහම
පිය  නගනා යුගය එළඹී ඇත    ළඟම
නිව  හල් රටක් ලෙස ලොව හෙට    වැජඹෙත්ම
සුව  සෙත සැමට නියතයි එන    වසරෙදි ම

සළකමු  සැවොම ලක් මවගේ දරුවන්    සේ
ඉවසමු  එකිනෙකා වෙත එක මල පෙති    සේ
සැරසෙමු හදන්නට රට යළි නොවැටෙන    සේ
පිබිදෙමු  රටක් ලෙස නිවහල් හෙට    දවසේ

නීතිය  සැමට පොදු පිළිසරණක්    වේවා
සාමය  රටේ නොනිමෙන පහනක්    වේවා
ජාතිය  සිහල ලොව හැම කල්    වැජඹේවා
විස්සයි විස්ස සුබ නව වසරක්    වේවා !



